

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ**
**ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன**
**Sri Lanka Podujana Peramuna**

පොදුජන පැතුම් වපුරන රණකොත

## මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජාතික සංවිධායක ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා අත්අඩංගුවට ගැනීම හා ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට ඇති තර්ජනය.

අප පක්ෂයේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මැතුමන්ව 2026.09.04 වන දින අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන් අප පක්ෂය දැඩිව සැලකිලිමත් වන අතර පක්ෂයක් ලෙස අප එම ක්‍රියාව සම්පූර්ණයෙන් හෙලා දකිමු.

අප සලකනුයේ මෙය හුදෙක් නාමල් රාජපක්ෂ යන පුද්ගලයා අත්අඩංගුවට ගැනීමක් ලෙස නොව මුළු මහත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එල්ල කල දැඩි ප්‍රහාරයක් ලෙස වන අතර මේ තුලින් ආණ්ඩු බලය අවභාවිතා කිරීම යන ගැඹුරු ප්‍රශ්නාර්ථය නැගෙන බව සදහන් කරමු.

මේ වන විට අතිශය පීඩාවට පත් වී ඇති ශ්‍රී ලාංකේය ගොවි ජනතාව ඇතුලු වත්මන් ආණ්ඩුවේ අදූරදර්ශී හා අමනෝඥ ක්‍රියා දාමයක් යටතේ පීඩාවට පත්ව ඇති සමස්ථ ශ්‍රී ලාංකේය ජනතාව එක් කරගත් අති දැවැන්ත ජන රැළියක් එළඹෙන 2026 සැප්තැම්බර් මස 12 වන දි අනුරාධපුර නගරයේ පැවැත්වීමට සියලු කටයුතු සම්පූර්ණ වෙමින් තිබූ අවස්ථාවක හා ජන රැළිය සඳහා දැවැන්ත ජන සහභාගීත්වයක් ඇති වන බවට තොරතුරු ලැබෙමින් තිබූ අවස්ථාවක මෙම අත්අඩංගුවට ගැනීම සිදු කිරීම ඉතා ප්‍රශ්න සහගත වේ. තවද නාමල් රාජපක්ෂයන් විසින් අනාගත ශ්‍රී ලංකාව සහ ලාංකීය තරුණ අනාගතය වෙනුවෙන් සිය දර්ශනය ජනගත කරමින් තිබූ අවස්ථාවක ඔහුගේ හඩ යටපත් කිරීමට ආණ්ඩුවට ඇති අවශ්‍යතාවය අප පක්ෂයක් ලෙස අවබෝධ කරගෙන සිටිමු.

ඒ අනුව අප විශ්වාස කරන්නේ මෙම අවස්ථාවේ මෙම සිදු කල අත්අඩංගුවට ගැනීම අහම්බයක් නොවන බවයි.

වත්මන් පාලකයින් ආණ්ඩුකරණයේ සියලු අංශයන්ගෙන් අසාර්ථක වී ඇති මොහොතක ඔවුන් විසින් මේ සිදුකරනු ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඉස්මතු වෙමින් පවතින මාලිමා ආණ්ඩු විරෝධී ජනමතය සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස රැස්වීමට අදහස් ප්‍රකාශ කිරීමට හා නිර්භයව තමන්ගේ සහ රටේ අනාගතය වෙනුවෙන් තීන්දු ගැනීමට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය යටපත් කිරීමේ උත්සහයයි.

නාමල් රාජපක්ෂ මැතිතුමන්ව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්තුමන් වෙත 2026.09.04 ඉදිරිපත් කොට ගරු මහේස්ත්‍රාත්තුමන් විසින් ඔහුව 2026.09.18 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද අතර එය සිදු කරනු ලැබුවේ 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනතේ 149 වන වගන්තිය යටතේය. එම ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් කරනු ලබන සැකකරුවෙකු ඇප මත මුදා හැරීමට ගරු මහේස්ත්‍රාත්වරයාට ඇති සීමාවන් සම්බන්ධයෙන් අප දැනුවත් අතරම අප වෙත ඇති



නො. 1316, නෙළුම් මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
இல. 1316, நெலும் மாவத்தை, ஜெயந்திபுரம், பத்தரமுல்லை, இலங்கை.
No. 1316, Nelum Mawatha, Jayanthipura, Battaramulla, Sri Lanka.
Tel: 011 2866277 Fax: 011 2866007 Email info@slpp.org.lk